# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පාලිත තෙවරප්පෙරුම පදනම
## (සංස්ථාගත කිරීමේ)

**පාලිත තෙවරප්පෙරුම පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පොළොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා විසින්
2017 ජනවාරි මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 දෙසැම්බර් මස 19 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[157 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# පාලිත තෙවරප්පෙරුම පදනම
# (සංස්ථාගත කිරීමේ)

**පාලිත තෙවරප්පෙරුම පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"පාලිත තෙවරප්පෙරුම පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක   දරන පාලිත තෙවරප්පෙරුම පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පාලිත තෙවරප්පෙරුම පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලිත තෙවරප්පෙරුම පදනමේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පාලිත තෙවරප්පෙරුම පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) රටේ සාමාජයීය සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ ජීවත්වන සියලුම ජාතීන්ට සමගියෙන් හා සහජීවනයෙන් ජීවත්වීමට අවශ්‍ය සියලු උපදෙස් සහ ආධාර ලබාදීම;

(ඇ) නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඈ) දිළිඳු සහ අසරණ අය සඳහා නිවාස, සෞඛ්‍ය පහසුකම්, පිරිසිදු පානීය ජල අවශ්‍යතාවන් සපුරාලීම;

(ඉ) අධ්‍යාපනය ලබන දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සැපයීම;

(ඊ) අඩු ආදායම්ලාභී දරු දැරියන්, තරුණ තරුණියන් සහ වැඩිමහල් අයගේ පෝෂණ තත්ත්වයන් නගාසිටුවීම සහ ක්‍රීඩා දක්ෂතාවන් වැඩි දියුණු කර ජාතික මට්ටමට ගෙන යාමට කටයුතු කිරීම;

(උ) පෙර පාසල් ළමුන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම හා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඌ) අධ්‍යාපනය සහ සංස්කෘතික හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම;

(එ) හදිසි ආපදාවල වින්දිතයන්ට සහාය දීම හා ඔවුන්ට තම ජීවන තත්ත්වය නගාසිටුවා ගැනීම සඳහා ආධාර ලබා දීම හා දිළිඳු තැනැත්තන්ට අවශ්‍ය අවස්ථාවන් හි නීති ආධාර හා නීති උපදෙස් ලබා දීම;

(ඒ) අඩු ආදායම්ලාභී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය අධ්‍යාපන කටයුතු ඵලදායී ලෙස ඉටු කරගැනීමට පහසුවන පරිදි ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඔ) ජාති, ආගම්, කුල බේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික සංස්කෘතික, කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම සඳහා ආධාර උපකාර කිරීම; සහ

(ඕ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සභාපති, නියෝජ්‍ය සභාපති, ලේකම්, සහ තවත් සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර, ඉන් අනතුරුව එවකට සභාපතිවරයා ලෙස ධුරය දරන තැනැත්තාගේ ළඟම ඥාතියා, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළඟ සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග බාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන්, සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද, බලය ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය. එකී රැස්වීම්වල ගණපූරණය ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු සඳහා අවශ්‍ය කරන සුදුසුකම්; සහ

(ඉ) සංස්ථාවේ දේපළ, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් ඉහත උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන්ම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් සහ සංස්ථාවට ගෙවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක් බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී හා කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි ලැබීමක් කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, එම දේපළ සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතුය. තවද සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

10. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය

සංස්ථාවේ ගිණුම් සහ විගණනය.

11. (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයෙකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂා කොට විගණනය කර ගත යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) පදනමේ ගිණුම්, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් වත් පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන විගණකවරයෙකු හෝ විගණකවරයන් විසින් ආදායම සහ වියදම පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයෙකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයේ තම නම් ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තෙකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.